ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සහකාර ආරක්ෂක නිලධාරී තනතුරේ සේවය කිරීමට කොන්ත්‍රාත් පදනම යටතේ බඳවා ගැනීමට සලකා බැලීම සඳහා ත්‍රිවිධ හමුදාවේ/පොලිස් විශේෂ කාර්යය බලකායේ නිත්‍ය සේවයේ රාජකාරී කරන ලද සුදුසුකම් ලත් මනා පළපුරුද්දක් සහිත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# සහකාර ආරක්ෂක නිලධාරී තනතුර

## (කොන්ත්‍රාත් පදනම මත)

### 1.0 කාර්යය / වගකීම්:

- ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම සේවකයින්ට තම කාර්යයන් ප්‍රශස්ත මට්ටමින් ඉටු කිරීමට පහසුකම් සැලසීම සඳහා සුදුසු ආරක්ෂිත වටපිටාවක් සහතික කිරීම.
- ඇති විය හැකි බාහිර අවදානම් වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින් සහ එහි දේපල ආරක්ෂා කිරීම.

### 2.0 අවශ්‍ය අවම සුදුසුකම්:

**2.1 අධ්‍යාපන සුදුසුකම්**

අ.පො.ස (සා.පෙළ) විභාගයේදී, අවම වශයෙන් විෂයයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබීම.

**2.2 ශාරීරික යෝග්‍යතාවය**

| | | |
|---|---|---|
| උස | (i) පිරිමි: සෙන්ටිමීටර 167.5 (5' 6") හෝ වැඩි | |
| | (ii) ගැහැණු: සෙන්ටිමීටර 162.5 (5' 4") හෝ වැඩි | |
| බර | (i) පිරිමි: 17 < ශරීර ස්කන්ධ දර්ශකය (BMI) < 26 | |
| | (ii) ගැහැණු: 17 < ශරීර ස්කන්ධ දර්ශකය (BMI) < 25 | |
| පපුව | (i) පිරිමි: 32" (අවම) | |

**2.3 වයස**

පිරිමි: 2023.11.15 දිනට අවුරුදු 40 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

ගැහැණු: 2023.11.15 දිනට අවුරුදු 35 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

**2.4 පළපුරුද්ද**

- පිරිමි පුද්ගලයින් සඳහා අවම වශයෙන් අවුරුදු 22 ක සහ කාන්තාවන් සඳහා අවම වශයෙන් අවුරුදු 15 ක කාලයක් ත්‍රිවිධ හමුදාවේ හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ නිත්‍ය සේවයේ නිකැළැල් අඛණ්ඩ සේවයක් සපුරා තිබීම.
- විශේෂ බලකා, රෙජිමේන්තු, පාබල හමුදා, පුපුරණ ද්‍රව්‍ය, විනය ආරක්ෂක, අවි ආයුධ හෝ ශාරීරික පුහුණු උපදේශක, සහ ගිනි ආරක්ෂක වැනි ක්ෂේත්‍රවල විශේෂඥතාව අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**2.5 ත්‍රිවිධ හමුදාවේ/ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ දැරූ නිලය**

ශ්‍රී ලංකා යුධ හමුදාවේ සැරයන් නිලය (Sergeant), ශ්‍රී ලංකා නාවික හමුදාවේ සුළු නිලධාරී (Petty Officer) සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සැරයන් නිලය (Sergeant) හෝ ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ I වැනි පන්තියේ සැරයන් නිලය (Sergeant Class I) හෝ ඊට ඉහළ නිලයක් දැරූ විශ්‍රාමික නිලධාරියෙකු විය යුතුය.

**අයදුම්පත සමඟ අධ්‍යාපනික සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැක.**

### 3.0 සේවා කාලය:

ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවශ්‍යතාවය හා බඳවා ගනු ලැබූ නිලධාරීන්ගේ සතුටුදායක කාර්ය සාධනය මත පදනම්ව උපරිම වසර තුනක් (03) දක්වා සෑම වසරක් අවසානයේදීම සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

### 4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ:

සියලු දීමනා ඇතුළත්ව මසකට රුපියල් 100,000/- ක, බද්දට යටත් වේතනයක් ගෙවනු ලබන අතර වැටුපෙන් 12%කට සමාන මුදලක් සේවක අර්ථසාධක අරමුදලට සහ වැටුපෙන් 3%කට සමාන මුදලක් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට දායකත්ව මුදල් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යොදවනු ඇත.

### තෝරා ගැනීමේ ක්‍රමය

ලිඛිත පරීක්ෂණයකින් අනතුරුව පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයකින් සහ සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් සුදුසු අපේක්ෂකයින් තෝරා ගනු ලැබේ

### අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, **https://www.cbsl.gov.lk/en/careers** යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර, අවශ්‍ය සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2023.11.15 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

අයදුම්පත් එවීමේ දී "සහකාර ආරක්ෂක නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)" යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත්, අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හෝ නියමිත ආකෘතියට අනුව සකස් නොකරන ලද අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සහතිකපත්‍ර පරීක්ෂා කරන අවස්ථාවේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා පත් කරගනු නොලැබේ.

තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ.

බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කිරීම, බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුය. බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සලකා බලනු ලැබේ.


**අධ්‍යක්ෂ - මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**
**දුරකථන: 0112 - 477330 ෆැක්ස්: 0112 - 477715**